ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධිය - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

අධ්‍යාපන මනෝ විද්‍යාව - **ESU 3211**

කාලය පැය තුනයි.

---

දිනය - 2008.08.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලටද 2 වන කොටසින් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සිසුන්ගේ අන්තර්ඥාන ඉගෙනුම වැඩි දියුණු කිරීමට ගුරුවරයකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් (03) යෝජනා කරන්න.'''

02. පර්යේෂණාත්මක ක්‍රම යටරතේ සලකා බැලිය නොහැකි ළමා අධ්‍යයන ක්‍රම තුනක් නම් කර, ඉන් එකක් සැකෙවින් විස්තර කරන්න.

03. "ළමා අවධිය කෙනෙකුගේ ජීවිතයේ ඉතාමත් වැදගත් අවධියකි." මෙම අදහසට පක්ෂව හේතු තුනක් දක්වන්න.

04. සිසුන්ගේ ස්වයං පෙළඹීම වැඩි දියුණු කිරීමට ගුරුවරයකුට යොදාගත හැකි ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ඔබගේ සිසුන්ට ප්‍රාථමික අත්දැකීම් ලබා ගැනීම සඳහා ඔබ යොදා ගන්නා ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

06. සංකල්ප සාධන ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන පියවර දෙක කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ළමයෙකුගේ 'වැඩීම' හා 'සංවර්ධනය' යන පද නිදසුන් දක්වමින් සංසන්දනය කරන්න.

08. "සූදානම කෙනෙකුගේ ඉගෙනුම කෙරෙහි බලපාන වැදගත් සාධකයකි." එම අදහස සනාථ කිරීමට සුවිශේෂී නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න.

OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

## 02 වන කොටස

09. ගුරුවරයකුට අධ්‍යාපන මනෝවිද්‍යාව හැදෑරීමේ වැදගත්කම පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

i. ළමා චර්යා අවබෝධ කර ගැනීමට
ii. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානයට
iii. ශිෂ්‍ය සාධනය ඇගයීමට හා ප්‍රතිපෝෂණය ලබා දීමට

10. i. ගුරුවරයකුට ඉගෙනුම් න්‍යායයන් අධ්‍යයනය කිරීමේ ප්‍රයෝජන තුනක් පැහැදිලි කරන්න.

ii. ඕනෑම ඉගෙනුම් න්‍යායන් දෙකක් තෝරාගෙන ඒවා අතර වෙනස්කම් පහත සඳහන් මාතෘකා යටතේ පැහැදිලි කරන්න.

අ. ඉගෙනුම සිදුවන ආකාරය
ආ. ඉගෙනුම අභිප්‍රේරණය කළ හැකි ආකාරය
ඇ. ගුරුවරයාගේ හා සිසුන්ගේ භූමිකාවන්

11. i. සිසු චර්යා අධ්‍යයනය පිණිස භාවිත කල හැකි 'පර්යේෂණාත්මක ක්‍රම' හා පර්යේෂණාත්මක නොවන ක්‍රම කෙටියෙන් විස්තර කරන්න.

ii. ඔබගේ පන්ති කාමරයේ සිසුන් අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණාත්මක ක්‍රම කෙසේ භාවිතා කරන්නේ දැයි සුදුසු නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

12. i. ඔබගේ සිසුන්ගේ පෙළඹීම පැහැදිලි කිරීමෙහි ලා මාස්ලෝ න්‍යායේ අදාලත්වය පැහැදිලි කරන්න.

ii. ඉහළ මට්ටමේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට සිසුන්ට උපකාර කිරීම සම්බන්ධ ගුරු භූමිකාව පරීක්ෂා කරන්න.

iii. ආත්ම සාක්ෂාත්කරණ අවශ්‍යතා සම්පූර්ණකර ගැනීමට පොළඹවනු ලැබූ පුද්ගලයකුගේ චර්යා ලක්ෂණ 5 ක් ලැයිස්තු ගත කරන්න.

13. පහත සඳහන් ඕනෑම මාතෘකා තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ළමයින්ගේ සංවර්ධනයට දායක වන ප්‍රධාන සාධක
ii. සමබර පෞරුෂයක් ඇති පුද්ගලයකුගේ ලක්ෂණ
iii. මේරීම හා ඉගෙනීම අතර ඇති සම්බන්ධය
iv. එරික්-එරික්සන් ගේ මනෝ- සමාජ න්‍යායට අනුව පෞරුෂවර්ධනය

14. i. පියාජේ විසින් පැහැදිලි කරන ලද සංවර්ධන අවධි, අදාළ වයස් කාල ප්‍රමාණය සමග ලැයිස්තු ගත කරන්න.

ii. පියාජේ විසින් විස්තර කරන ලද එක් එක් අවධිවල සුවිශේෂී ගති ලක්ෂණ තුන (3) බැගින් සුදුසු නිදසුන් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ශිෂ්‍ය ඉගෙනුම වැඩි දියුණු කිරීම පිණිස ඉහත න්‍යායේ වැදගත්කම විශ්ලේෂණය කරන්න.

- හිමිකම් ඇවිරිණි. -